**ශීර්ෂය 318 - ඌව පළාත් සභාව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2018 වර්ෂය**

1. දැක්ම, මෙහෙවර හා කාර්යභාරය

1.1 දැක්ම

ඌව අභියෝගයෙන් අභිමානයට

1.2 මෙහෙවර

ඌව පළාත තුළ පවත්නා හා බාහිර වශයෙන් ලබාගන්නා සීමිත සම්පත් ප්‍රශස්ථ ලෙස යොදවා ඌව පළාතේ ජනතාවගේ ආර්ථික, සමාජයීය, ශාරීරික හා මානසික සංවර්ධනය ඇති කරලීම තුළින් ඔවුන්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීම හා අන්‍යෝන්‍ය විශ්වාසය හා සාමකාමී බව ප්‍රවර්ධනය කිරීම ඌව පළාත් සභාවේ මෙහෙවර වේ.

1.3 කාර්ය භාරය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන පරිදි කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම.

2. මූල්‍ය ප්‍රකාශන

මුළු ප්‍රතිපාදනය හා වියදම

ඌව පළාත් සභාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 20,547.80 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 19,053.00 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 1,494.80 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 7.27 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2018 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 16,268.40 | 16,268.40 | - | - |
| මූලධන | 4,279.40 | 2,784.60 | 1,494.80 | 34.93 |
| එකතුව | 20,547.80 | 19,053.00 | 1,494.80 | 7.27 |

3. විගණන නිරීක්ෂණය

ශීර්ෂය යටතේ පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදන පළාත් සභාව විසින් පළාත් සභාවේ අරමුදල යටතේ ගිණුම්ගත කර උපයෝජනයන් සිදු කර තිබුණි. පළාත් සභාවේ අරමුදල විගණනය කර ඒ පිළිබඳ විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.